# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
## CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. : CSS/03/01/පොදු/Covid – 19 | ඔබේ අංකය / உமது இல / Your Ref. : | දිනය / திகதி / Date : 2021.05. 20 |

**ප්‍රමුඛ කාර්යයකි**

දකුණු පළාත් සභාවේ
ආණ්ඩුකාර ලේකම්,
සභා ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/මුදල්/පිරිස්/සැලසුම්/ඉංජිනේරු සේවා),
අමාත්‍යංශ ලේකම් (ප්‍රධාන/ක්‍රීඩා/අධ්‍යාපන/කෘෂිකර්ම/ධීවර) අමාත්‍යාංශය,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ප්‍රාදේශීය ලේකම්වරුන් සහ
සියළුම ආයතන ප්‍රධානීන් වෙත.

**Covid 19 තත්වයට අදාළ එන්නත්කරණ වැඩසටහන**

මේ වන විට රට තුළ උද්ගත වී ඇති Covid - 19 තත්වය හමුවේ රාජ්‍ය සේවය බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා දකුණු පළාත් සභාව යටතේ පවතින රාජ්‍ය නිලධාරීන් හට Covid - 19 තත්ත්වයට අදාළ එන්නත් ලබා දීමේ වැඩසටහනක් ආරම්භ කිරීමට අදහස් කර ඇති බව සතුටින් දැනුම් දෙමි.

02. එකී වැඩසටහන අදියර 02ක් යටතේ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන අතර, පළමු අදියර යටතේ **රජයේ ආයතනවල අවම සේවාවන් පවත්වා ගැනීමට අත්‍යාවශ්‍ය රාජකාරී සිදුකරන නිලධාරීන්** හට එන්නත් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

03. ඒ අනුව, මාණ්ඩලික හා මාණ්ඩලික නොවන එනම්, **සියළු තනතුරු ඇතුළත්ව ආයතනවල අත්‍යාවශ්‍ය රාජකාරී ඉටුකරන නිලධාරීන්ගේ තොරතුරු** ඇමුණුම 01 ආකෘතිය ප්‍රකාරව 2021.05.21 දින මධ්‍යහ්න 12.00ට පෙර chiefsec03@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

04. එකී ලේඛනයේ සඳහන් නිලධාරීන්ගෙන් ද අත්‍යාවශ්‍ය සේවාවන් ඉටුකරන නිලධාරීන්ගේ නම් පැහැදිලිව සඳහන් කළ යුතුවේ.

05. එමෙන්ම, එන්නත්කරණ වැඩසටහනේ දෙවන අදියර යටතේ අනෙකුත් සියළු නිලධාරීන්ගේ තොරතුරු 2021.06.15 දිනට පෙර මා වෙත ලැබීමට පියවර ගන්නා ලෙස වැඩිදුරටත් දන්වමි.

06. මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු දැනගැනීමට අවශ්‍ය වන්නේ නම්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) ක්‍රිසන්ත ඩබ්. මහේන්ද්‍ර මහතා (0777302047 / 0714479797) අමතා තොරතුරු විමසිය හැක.

07. එසේම, ඔබ අමාත්‍යාංශයට හෝ දෙපාර්තමේන්තුවට අයත් අනෙකුත් සියළුම ආයතනවල නිලධාරීන් වෙත ද මේ සම්බන්ධයෙන් නොපමාව දැනුම් දීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

**ආර්. සී. ද සොයිසා**
**ප්‍රධාන ලේකම්**
**දකුණු පළාත**

ආර්.සී.ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary : 091 2232343 | කාර්යාලය / காரியாலயம் / Office : 091 4119010, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax : 091 2246299 | විද්‍යුත් තැපැල / மின் அஞ்சல் / E-mail : chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site : www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එච්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"විශිෂ්ටත්වයෙන් ① ට එන යහපාලනයක්"

ඇමුණුම 01

අමාත්‍යාංශය :-

දෙපාර්තමේන්තුව :-

ආයතනය :-

| අනු අංකය | නම | තනතුර | ජාතික හැඳුනුම්පත් අංකය | දුරකථන අංකය | |
|---|---|---|---|---|---|
| | | | | රාජකාරී | පෞද්ගලික |
| | | | | | |